රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: ආර්/3/3/2016
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018.02.23

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ</u>**

**<u>විවෘත හා සීමිත තරග විභාගය - 2016(2017)</u>**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය 2016(2017) ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර මේ වන විට කැඳවුම් ලිපි අයදුම්කරුවන් වෙත තැපෑලෙන් යොමු කර ඇත. එහිදී විවෘත හා සීමිත විභාග නිවේදනවල සඳහන් අපේක්ෂිත මූලික සහ අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇතිබව සනාථ වන්නේ නම් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් සඳහා තෝරාගනු ඇත.

02. තවද කැඳවීම් ලිපියේ සඳහන් පරිදි ඔබ 2018/02/20 දින පෙ.ව. 8.00 සිට 2018.02.28 දින මධ්‍යම රාත්‍රී 12 දක්වා කාලය තුළ 203.94.94.214/cs-rec2018 වෙබ් අඩවියට පිවිස ඔබගේ පෞද්ගලික තොරතුරු යාවත්කාලීන කළයුතු වේ. වෙබ් අඩවියට පිවිසි පසු ඔබගේ කැඳවීම් ලිපියේ උපදෙස් පරිදි භාවිත නාමය (User Name) සහ මුරපදය සටහන් කර ප්‍රවේශ වී "Home"අතුරු මුහුණතේ දිස්වෙන උපකාරක ගොනුවට (Help File.pdf) පිවිස උපදෙස් හොඳින් කියවන්න. අනතුරුව Recruitment මෙනුව වෙත පිවිස ඔබගේ තොරතුරු ඇතුළත් කළ යුතු වේ.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන දින සහ වේලාවන්ද රැගෙන ආ යුතු ලිපිලේඛන හා ආකෘතිපත්‍ර පහතින් දැක්වේ.

| | | | |
|---|---|---|---|
| සම්මුඛ පරීක්ෂණ දින සහ වේලාවන් | <u>විවෘත</u> | <u>සීමිත</u> | <u>ආබාධිත කොන්දේසි යටතේ</u> |
| රැගෙන ආයුතු ලේඛන | <u>විවෘත</u> | <u>සීමිත</u> | <u>ආබාධිත කොන්දේසි යටතේ</u> |
| ආකෘතිපත්‍ර | <u>විවෘත</u> | <u>සීමිත</u> | |

**නියමිත දිනයේ සම්මුඛ පරීක්ෂණයට නොපැමිණීම පත්වීමක් ලබා ගැනීම සඳහා ඔබගේ අපේක්ෂාවක් නොමැති සේ සළකනු ලබන අතර, මේ සම්බන්ධයෙන් පසුව කරනු ලබන කිසිදු විමසීමක් මොනම හේතුවක් මත හෝ සළකා බලනු නොලැබේ.**

කේ.වී.පී.එම්.ජේ. ගමගේ

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්